

# රක්ෂණාවරණයක් මිලදී ගැනීම

INSURANCE
REGULATORY
COMMISSION
OF SRI LANKA


වෙළඳපොළ සංවර්ධන හා බාහිර සබඳතා අංශය
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව












වර්ෂ 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ, 2001 මාර්තු මස පිහිටුවන ලද ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ අරමුණ හා වගකීම වනුයේ වත්මන් හා අනාගත රක්ෂණ ඔප්පුහිමියන්ගේ සුරක්ෂිතභාවය තහවුරු වන පරිදි, ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාරය ගෞරවාන්විතව, වෘත්තීමය බවින් යුතුව හා විචක්ෂණශීලීව කරගෙන යනු ලබන බවට වග බලාගැනීමයි.

ඒ අනුව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතට අනුකූලව රීතින්, චක්‍රලේඛ, නියෝග හා විධිවිධානයන් සකස් කිරීම, අවශ්‍ය සංශෝධන හා අනෙකුත් අදාල උප නීති සකස් කිරීම, තුලින් රක්ෂණ කර්මාන්තයේ වර්ධනයට හා රක්ෂණ ඔප්පුහිමියන්ගේ ආරක්ෂාව උදෙසා නිතිපතා පියවර ගනු ලබයි.

රක්ෂණයක් යනු, නීත්‍යානුකූල ගිවිසුමකි. එය රකෂිතයා හා රක්ෂණ සමාගම අතර ඇති කරගන්නා ගිවිසුමක් වේ. රක්ෂණයක් මිලදී ගැනීමේදී හොඳ අවබෝධයකින් එය සිදුකළ යුතුය. එබැවින් රක්ෂණයක් මිලදී ගැනීමේදී සලකා බැලිය යුතු කරුණු සහ රක්ෂණයේ වැදගත්කම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම රක්ෂණ කර්මාන්තය හා සම්බන්ධ සියලු පාර්ශවකරුවන්ගේ වගකීමකි.

# 1.

## රක්ෂණාවරණයක් මිලදී ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු




පුද්ගලයන් හා ආයතන විසින් මුහුණ දීමට ඉඩකඩ තිබෙන අවදානම් ආවරණය වන පරිදි නිකුත්කර ඇති විවිධ රක්ෂණාවරණ වෙළඳපොලේ පවතින අතර මෙවැනි රක්ෂණාවරණ නිකුත්කිරීමේ හා ගිවිසුම් වලට පිවිසීමට නීත්‍යානුකූල බලය ඇත්තේ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ලියාපදිංචි රක්ෂණ සමාගමකට පමණි. මෙවැනි ලියාපදිංචි රක්ෂණ සමාගම් පිළිබඳ තොරතුරු ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ඇමතීමෙන් හෝ එහි වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැක. *(https://ircsl.gov.lk/insurance-companies)*

# 2.

## රක්ෂණාවරණයක් අලෙවි කිරීමට නීත්‍යානුකූල බලය ඇත්තේ කාහටද?



රක්ෂණාවරණයක් අලෙවි කළ හැක්කේ රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ලියාපදිංචි රක්ෂණ සමාගමකට හෝ ඔවුන්ගේ බලයලත් රක්ෂණ නියෝජිතයෙකුට හෝ ලියාපදිංචි රක්ෂණ තැරැව්කාර සමාගමකට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයෙකුට පමණි.

වර්තමානයේ තාක්ෂණික දියුණුව හේතුවෙන් රක්ෂණ සමාගම් හා රක්ෂණ තැරැව්කාර සමාගම් විවිධ මාධ්‍යයන් උපයෝගී කරගනිමින් රක්ෂණාවරණ අලෙවි කරනු ලබයි. එනමුත්, මෙහිදී දැනගත යුතු වැදගත් කාරණය වන්නේ රක්ෂණාවරණ අලෙවිකිරීමට නීත්‍යානුකූල අයිතිය ඇති පුද්ගලයෙකුගෙන් එය මිලදී ගැනීමට වග බලා ගැනීමයි. යම්කිසි පුද්ගලයෙකුට රක්ෂණාවරණ අලෙවි කිරීමට නීත්‍යානුකූල අයිතිය ඇත්තේද යන්න පිළිබඳ සැකයක් පවතින්නේ නම් අදාල රක්ෂණ සමාගමෙන්, රක්ෂණ තැරැව්කාර සමාගමෙන් හෝ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙන් විමසා දැනගත හැකිය.

**“රක්ෂණාවරණයක් අලෙවි කළ හැක්කේ රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ලියාපදිංචි රක්ෂණ සමාගමකට හෝ ඔවුන්ගේ බලයලත් රක්ෂණ නියෝජිතයෙකුට හෝ ලියාපදිංචි රක්ෂණ තැරැව්කාර සමාගමකට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයෙකුට පමණි.”**

අතරමැදියන් සම්බන්ධයෙන් සාකච්ඡා කරන විට විශේෂ කරුණක් වනුයේ රක්ෂණ තැරැව්කාර සමාගමකට, ලියාපදිංචි ඕනෑම රක්ෂණ සමාගමක රක්ෂණ ඔප්පුවක් අලෙවි කළ හැකි අතර රක්ෂණ නියෝජිතයෙකුට සිය සේවාව ලබාදිය හැක්කේ තමන් ලියාපදිංචි වී ඇති රක්ෂණ සමාගමට (එක් ජීවිත රක්ෂණ ව්‍යාපාරයේ යෙදෙන රක්ෂණ සමාගමක් හා එක් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ යෙදෙන සමාගමක්) හෝ තැරැව්කාර සමාගමට පමණක් වීමයි. නියෝජිතයෙකු වුවද, තැරැව්කාර සමාගමක් වුවද තමන් අලෙවි කරන රක්ෂණාවරණය ගැන හොඳ අවබෝධයක් තිබීම වැදගත් වේ.

## තමන්ට සුදුසු රක්ෂණාවරණය පමණක් මිලදී ගත හැක්කේ කෙසේද?




- රක්ෂණාවරණයක් ලබාගැනීමේ අවශ්‍යතාවය කුමක්ද යන වග පළමුවම ඔබ අවබෝධ කරගත යුතුය. ඉන්පසු එම අවශ්‍යතාවයට සරිලන රක්ෂණාවරණය කුමක්ද යන්න පිළිබඳව රක්ෂණ සමාගමකින්, රක්ෂණ තැරැව්කාර සමාගමකින්, හෝ නියෝජිතවරයෙකුගෙන් විමසා අවබෝධ කරගත යුතුය.

- ඔබට ගෙවිය හැකි වාරික මුදලකට රක්ෂණාවරණය මිලදී ගැනීමද වැදගත්ය. ජීවිත රක්ෂණයක් සඳහා දීර්ඝ කාලයක් වාරික ගෙවීමට සිදුවන බැවින් එම කාලය තුළ අඛණ්ඩව ගෙවිය හැකි වාරික මුදලක් තෝරාගත යුතුය. අනවශ්‍ය අතිරේක රක්ෂණාවරණ ලබා ගැනීමෙන් වැලකීමද ඉතා වැදගත් කරුණකි. ඔබට සුදුසු රක්ෂණාවරණය හා දැරිය හැකි වාරික මුදල ගැන වැඩි අවබෝධයක් තිබෙන්නේ ඔබට බැවින් ඒ පිළිබඳව සැලකිලිමත් වීම වැදගත් වේ. මිලදී ගන්නා රක්ෂණයට අදාල ගිවිසුමේ අකෘති පත්‍ර / රක්ෂණයට අදාළ අත්පත්‍රිකා හොඳින් කියවා බලා අවබෝධ කරගත යුතු අතරම රක්ෂණ හිමිකම් ගෙවන අවස්ථා සහ හිමිකම් නොගෙවන අවස්ථා, එනම් බැහැර කරන අවස්ථා (Exclusions) ගැනද අසා දැනුවත් වීම අත්‍යවශ්‍ය වේ. රක්ෂණාවරණයක් ලබාගැනීමේදී ඉක්මන් නොවිය යුතු අතර සියලු තොරතුරු අධ්‍යයනය කර තීරණය ගත යුතුය. එසේ කිරීම තුළින් රක්ෂණයක් මිලදී ගත් පසුව පැන නැගෙන ගැටළු අවම කර ගත හැකි වේ.

> **“රක්ෂණාවරණයක් මිලදීගැනීමේදී, ඔබගේ අවශ්‍යතාවයන්ට ගැලපෙන රක්ෂණාවරණයක් ලබා ගැනීම වැදගත්ය.”**

- රක්ෂණ සමාගම්, රක්‍ෂණ තැරැව්කාර සමාගම් හා රක්ෂණ නියෝජිතයන් විසින් අලෙවි කරන රක්ෂණාවරණ ගැන මනා අවබෝධයක් ඔවුන් සතුව තිබිය යුතු අතරම රක්ෂණය මිලදී ගන්නා පාරිභෝගිකයින් නිසි ආකාරයෙන් දැනුවත් කිරීමද ඔවුන් සිදුකළ යුතුය. පාරිභෝගිකයාට අවශ්‍ය හා ගැලපෙන රක්ෂණාවරණයක් අලෙවි කිරීමටද ඔවුන් වගබලා ගත යුතුය.

4.

## රක්ෂණ ඉල්ලුම්පත්‍රය/ යෝජනා පත්‍රය සම්බන්ධව සැලකිලිමත් වීම වැදගත් වන්නේ ඇයි?




තමන්ට අවශ්‍ය රක්ෂණාවරණයක් මිලදී ගැනීමේදී සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය එනම් යෝජනා පත්‍රය (Proposal Form) වැදගත් ලේඛණයක් සේ සැලකේ. ඉතා සැලකිලිමත්ව මෙය පිරවීම අත්‍යවශ්‍ය කරුණකි. ඊට හේතුව වනුයේ රක්ෂණ සමාගම විසින් දරන අවදානම තීරණය කිරීමට මෙහි අන්තර්ගත කරුණු සැලකිල්ලට ගනු ලබයි. යම් හිමිකමක් ඉල්ලුම් කිරීමේදී ද මෙහි ඇතුලත් කරුණු වැදගත් කොට සලකනු ලබයි. තමන් වෙනුවෙන් වෙනත් අයෙකු හෝ නියෝජිතයෙකු ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කරන අවස්ථාවක එය කියවා බලා පිළිතුරු නිවැරදි නම් පමණක් අත්සන් තැබිය යුතුය. හිස් යෝජනා පත්‍රවලට අත්සන් කිරීම සිදුනොකළ යුතු අතර, යම් අවස්ථාවක ඉල්ලුම්පත්‍රයේ/යෝජනා පත්‍රයේ අසත්‍ය තොරතුරු ඇතුලත් වී ඇත්නම් හිමිකම් ප්‍රතික්ෂේප වීමද විය හැකිය. රක්ෂණ ගිවිසුමද අවලංගු කළ හැකිය. රක්ෂණ ගිවිසුමකට එලඹීමේදී දෙපාර්ශවයම සත්‍ය කරුණු එළිදරව් කිරීම රක්ෂණ නීති සිද්ධාන්තයකි. මෙම නීති සිද්ධාන්තය කඩකිරීම හේතුවෙන් රක්ෂණ ගිවිසුම අවලංගු කළ හැකිය.

## රක්ෂණ ඔප්පුව කියවා අවබෝධ කරගැනීම හා වාරික ගෙවීම වැදගත් වන්නේ ඇයි?




රක්ෂණ ඔප්පුවක් සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවෙන් නිකුත් කිරීමට රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් රක්ෂණ සමාගම් වෙත නියෝග නිකුත් කර ඇත. එබැවින් ඔබට තේරුම්ගත හැකි භාෂාවකින් රක්ෂණ ඉල්ලුම්පත්‍රය පිරවීමත්, රක්ෂණ ඔප්පුව ලබා ගැනීමත් කළ හැක. රක්ෂණාවරණයක් මිලදී ගැනීමට පෙර ඔප්පුවේ පිටපතක් ලබාගෙන එය කියවා බලා ඔබගේ අවශ්‍යතාවයන්ට ගැලපෙන රක්ෂණාවරණයක්ද යන්න තහවුරු කරගැනීමට වගබලා ගන්න. යම් ලෙසකින් ඔබ මිලදී ගත් රක්ෂණාවරණය පිළිබඳව සෑහීමකට පත් නොවන්නේ නම්, රක්ෂණ ඔප්පුවේ සඳහන් කාලසීමාව තුලදී ගාස්තුවකට යටත්ව අවලංගු කිරීමේ අවස්ථාවක්ද ලබාදී ඇත. එමනිසා, ගිවිසුමට එළඹීමට පෙර සියලු කරුණු කාරණා ගැන අවබෝධය තිබීම ඉතා වැදගත්ය. රක්ෂණ ඔප්පුවේ අඩංගු කරුණු පිළිබඳව හොඳින් අවබෝධ කරගැනීම වැදගත් වන්නේ, හිමිකම් ගෙවීමේදී ඔප්පුවේ අඩංගු කොන්දේසි වලට අනුකූලව සිදුවන බැවිනි.

ජීවිත රක්ෂණ ඔප්පුවක්, ඔප්පුහිමියා අතට පත්වූ දින සිට දින 21 ක කාලපරිච්ඡේදයක් ඇතුළත ඔප්පුහිමියා හට එම රක්ෂණාවරණය සම්බන්ධයෙන් නැවත සලකා බැලීමක් සිදුකළ හැකිය. ඒ අනුව, රක්ෂණ ඔප්පුව අඛණ්ඩව පවත්වාගෙන යන්නේද, නැතහොත් අවලංගු කරන්නේද යන්න තීරණය කිරීම සිදුකළ හැකිය. ඔබ යම් හෙයකින් එම කාලපරිච්ඡේදය තුළ රක්ෂණාවරණය අවලංගු කිරීමේ විකල්පය තෝරාගනු ලැබුවහොත් රක්ෂණ සමාගම විසින් දරන ලද වියදම සඳහා ගාස්තුවකට යටත්ව එකී වාරික මුදල් ඔබ වෙත ගෙවනු ලැබේ.

එමෙන්ම වසර තුනක කාලයක් අඛණ්ඩව වාරික මුදල් ගෙවා ඇති අවස්ථාවක හෝ ගිවිසුමේ පවාරණ අගය ගන්නා කාලසීමාව වසර තුනකට වඩා අඩු කාල පරිච්ඡේදයක් නම්, ඒ සඳහා වාරික මුදල් ගෙවා ඇති අවස්ථාවක ඔබ රක්ෂණ ඔප්පුව අවලංගු කළ යුතු බව තීරණය කලහොත් එය රක්ෂණ සමාගම සමග සාකච්ඡා කර තීරණය කළ හැකිය. එහිදී ඔබේ රක්ෂණයට මුදල් අගයක් හෙවත් පවාරණ අගයක් ආරෝපණය වේ. එහි පවාරණ අගය රක්ෂණ සමාගමේ ජීවගණකඥ විසින් නිගමනය කරනු ලැබේ. ඔබේ රක්ෂණ ඔප්පුවේ පවාරණ අගය හා සම්බන්ධ විධිවිධානද කියවා අවබෝධ කරගැනීම ඉතා වැදගත් වේ. අදාළ රක්ෂණ ගිවිසුම අත්සන් කිරීමට පෙර මෙම විධිවිධාන පිළිබඳව ඔබේ රක්ෂණ සමාගමෙන්, රක්ෂණ තැරැව්කාර සමාගමෙන් හෝ රක්ෂණ නියෝජිතවරයාගෙන් සියලු කරුණු පිළිබඳ පැහැදිලි කිරීමක් ලබාගත හැකිය.

සාමාන්‍ය රක්ෂණයකද, වාරිකය රක්ෂණ ඔප්පුවේ සඳහන් දිනට පෙර ගෙවා නිමකළ යුතුය. නැතහොත්, යම්කිසි හිමිකම් පෑමකදී, එම හිමිකම් ගෙවීමේ වගකීමෙන් සමාගම නිදහස් වනු ඇත.

6.

## රක්ෂණය පිළිබඳ ගැටළුවකදී පැමිණිලි කළ හැකිද?




රක්ෂණ ක්ෂේත්‍රය තුළ රක්ෂණ ඔප්පුහිමියෙකුට යම් අසාධාරණයක් සිදු වූ විට ඒ සම්බන්ධව පැමිණිලි කර ගැටළුව විසඳා ගැනීමට විධිවිධාන සලසා ඇත. රක්ෂණ ඔප්පුහිමියෙකුට රක්ෂණ හිමිකම් ගෙවීම සම්බන්ධයෙන් වූ ගැටළුවකදී එය මුලින්ම අදාල රක්ෂණ සමාගමේ ඉහළ කළමණාකාරීත්වයට පැමිණිලි කළ යුතුය. එයින් සෑහීමකට පත්නොවන විටෙක ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත හෝ රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා වෙත පැමිණිලි කළ හැකිය. එසේ නැතහොත් අධිකරණයේ ඒ පිළිබඳව නඩුවක් පැවරීමේ හැකියාව ඇත.

රක්ෂණ නියෝජිතයෙකු අතින් සිදුවන මූල්‍ය වංචාවකදී, අදාල රක්ෂණ සමාගමට මෙන්ම ශ්‍රී ලංකා පොලීසිය වෙත පැමිණිලි කිරීම යෝග්‍යය.

# ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත පැමිණිලි යොමු කරන ආකාරය




**රක්ෂණ හිමිකමක් පිළිබඳව පැමිණිල්ලක් කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග**

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ බලතල ප්‍රකාරව රක්ෂණ ඔප්පුහිමියන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම උදෙසා පැමිණිලි විභාග කිරීම සිදු කරන අතර, ඒ සඳහා අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග පහත පරිදි වේ.

පළමුව ඔබගේ රක්ෂණ සමාගම වෙත පැමිණිල්ල යොමුකරන්න. රක්ෂණ සමාගමට පැමිණිල්ල යොමු කරන ආකාරය ගැන දැනගැනීම සඳහා https://ircsl.gov.lk/list-of-insurance-companies/ වෙත පිවිසෙන්න. සමාගම සාධාරණ කාලසීමාවක් ඇතුළත එය නිරාකරණය කර, ඒ සඳහා ඔබට පිළිතුරක් ලබා දිය යුතුය.

ඔබට රක්ෂණ සමාගමෙන් සාධාරණ කාලසීමාවක් තුල පිළිතුරක් නොලැබුනොත් හෝ පැමිණිල්ල නිරාකරණය කිරීම සම්බන්ධයෙන් ඔබ සෑහීමකටපත් නොවන්නේ නම්, ඔබගේ පැමිණිල්ල ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව හෝ රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා වෙත ඉදිරිපත් කල හැකිය.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත පැමිණිලි ඉදිරිපත් කළ හැකි ආකාරය පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා https://ircsl.gov.lk/policyholder-complaints/ වෙත පිවිසෙන්න.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් මහජනතාවට මාර්ගෝපදේශයක් වශයෙන් රක්ෂණාවරණයක් මිලදී ගැනීමේදී සැලකිය යුතු කරුණු පිළිබඳ මෙම අත්පොත නිකුත් කර ඇති අතර මෙහි ඒ පිළිබඳ සාමාන්‍ය තොරතුරු පමණක් අඩංගු වේ. මෙහි දක්වා ඇති කිසිදු තොරතුරක් රක්ෂණ ඔප්පුවක නියමයන් සහ කොන්දේසි ප්‍රතිස්ථාපනය හෝ ප්‍රතික්ෂේප නොකරයි. රක්ෂණ ඔප්පුවක් සම්බන්ධයෙන් නිශ්චිත තොරතුරු සඳහා හෝ වෙනත් අමතර තොරතුරු සඳහා රක්ෂණ සමාගම, රක්ෂණ තැරැව්කාර සමාගම හෝ රක්ෂණ නියෝජිතයා අමතා ලබා ගත හැක.

INSURANCE
REGULATORY
COMMISSION
OF SRI LANKA


**වෙළඳපොළ සංවර්ධන හා බාහිර සබඳතා අංශය**
**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව**
11 වන මහළ, නැගෙනහිර කුළුන,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01.
දුරකථනය - 0112 2396184-9 I ෆැක්ස් - 0112 2396190
විද්‍යුත් තැපෑල - mder@ircsl.gov.lk

www.ircsl.gov.lk

https://www.facebook.com/Ircslofficialpage/

https://www.linkedin.com/company/insurance-regulatory-commission-of-sri-lanka/

https://www.youtube.com/channel/UCuM9RLGQTi7B2MM7PL7jfiA



බැඳියාව හා නොපිළිගැනීම
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් මහජනතාවගේ දැනුවත්භාවය වැඩි දියුණු කිරීමේ අරමුණින් මෙම අත්පොත මුද්‍රණය කරන ලද අතර කිසිදු නීතී උපදෙස් සැපයීමේ ආදේශකයක් වශයෙන් මෙය උපයෝගී කරගත නොහැක.